**උඩුනුවර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**---------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 10 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 17 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 අභිතකර මතය**

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 අභිතකර මතය සඳහා පදනම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි අයිතම 05 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරන කරමි. |
| (ආ) | වටිනාකම රු.384,350 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි අයිතම 29 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඇ) | විධිමත් ලෙස සභාවට පවරා දී නොතිබූ රු.6,221,373 ක් වටිනා කම්පැක්ටරය වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඈ) | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වටිනාකම රු.134,282 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඉ) | කර්මාන්ත 04 ක් සඳහා ගෙවිය යුතු රු.236,912 ක් ණයහිමි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඊ) | බාහිර ප්‍රතිපාදන යටතේ ඉටු කළ කර්මාන්ත 06 කට අදාළ රැඳවුම් මුදල රු.532,100 ක් ණයගැතියන් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි ගෙවීම් රු.266,751 ක් වැඩිපුර හඳුනා ගෙන තිබුණි. | ණයහිමි ගෙවීම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | ස්ථාවර තැන්පත් පොලිය රු.636,805 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | පොලි නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (එ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.945,075 ක් ගිණුම්වල පෙන්වා නොතිබුණි. | ලැබිය යුතු මුදල් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

**1.3.2** <u>අසම්භාව්‍ය බැරකම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලංකා බැංකුව මඟින් අය කරන ලද රු.146,754 ක රඳවා ගැනීමේ බද්ද ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. | අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.3** <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 10 කට අදාළව ගිණුම අනුව වටිනාකම හා උපලේඛන අනුව, වටිනාකම අතර රු.18,113,176 ක නොසැසඳීමක් විය. | වෙනස්කම් හඳුනා ගෙන නිවැරදි කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

**1.3.4** <u>අවිනිශ්චිත ගිණුම්</u>

2019 ජනවාරි 01 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.8,995,776 ක බැර ශේෂයක් පැවති අතර, මෙම වටිනාකම සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජ'නල් සටහන් 05 ක් මඟින් අවිනිශ්චිත ගිණුමට හර හා බැර ලෙස සටහන් කර තිබූ රු.56,163,513 ක වටිනාකමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අවිනිශ්චිත ගිණුම නිවැරදි කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු.4,769,685 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

**1.3.5** <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම්<br>අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් හි එකතුව රු.8,987,411 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.9,377,110 ක් වී තිබුණි. | ලැබිය යුතු මුදල් අය කළ යුතුවේ. | ලිපි යවා දැනුවත් කර ඇති අතර, ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම්<br>අවුරුදු 01 ට වැඩි කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් හි වටිනාකම රු.1,985,475 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුවේ. | පොදු සැපයුම් ණයහිමි හැර අනෙකුත් මුදල් ගෙවා ඇත. |

**1.3.6** **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

(අ) <u>තොරතුරු ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.15,686,985 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අවශ්‍ය තොරතුරු නිවැරදිව පවත්වා ගෙන යා යුතුවේ. | ශේෂය හඳුනා ගෙන ඉදිරියේ දී නිවැරදි කරමි. |
| (ii) එකතුව රු.26,158,843 ක් වූ ගිණුම් විෂයන් 05 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අවශ්‍ය තොරතුරු නිවැරදිව පවත්වා ගෙන යා යුතුවේ. | ශේෂය හඳුනා ගෙන ඉදිරියේ දී නිවැරදි කරමි. |

(ආ) <u>ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු. 482,692 ක් වූ ගෙවීම් වවුචර් 16 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගනුදෙනු සඳහා වූ ගෙවීම් වවුචර් නිවැරදිව තබා ගත යුතුවේ. | ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

**1.3.7 අනුකූල නොවීම**

**1.3.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 2015 ජුලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 පරිදි සංශෝධිත මුදල් රෙගුලාසි 371 | වටිනාකම රු.45,000 ක් වූ අත්තිකාරම් මාස 04 සිට මාස 10 ක් දක්වා කාලයක් අත රඳවා ගෙන තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අත්තිකාරම් විෂය භාර නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ආ) | වෙනත් චක්‍රලේඛ | | | |
| (i) | 2016 මාර්තු 17 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 2016/03 හි | | | |
| | • 05 වගන්තිය | දවුලගල හා ගෙලිඔය කඩ කාමර 29 ක කුලි සංශෝධන සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කඩ කුලි සංශෝධනය කළ යුතුවේ. | සංශෝධන සඳහා අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. |
| | • 06 වගන්තිය | දවුලගල වෙළඳ සංකීර්ණයට අදාළව 2011 වර්ෂයේ තක්සේරුව ඇතුළත් කරමින් නව ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | නව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 1992 පෙබරවාරි 26 දිනැති නාගරික සංවර්ධන අධිකාරී අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 05/01/119 වෙළුම ix හි (1) වගන්තිය | පැය 02 ක කාලය ආවරණය නොවූ හා සැලසුම් කමිටුවට සහභාගී වූ බවට තහවුරු නොවූ නිලධාරීන්ට රු.84,400 ක් සැලසුම් කමිටු දීමනා ලෙස මුදලක් ගෙවා තිබුණි. | නිවැරදි ආකාරයට දීමනා ගෙවිය යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 1.3.8 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභා අනුමැතියකින් තොරව රු.1,893,000 ක් පොදු සැපයුම් ණයහිමි ලෙස හඳුනා ගෙන තිබුණි. | විධිමත් අනුමැතියක් යටතේ ගැලපීම් සිදු කළ යුතුවේ. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉල්ලීම් කර ඇත. |
| (ආ) | හිඟ කුලි මුදල් රු.65,814 ක් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | නිවැරදි අනුමැතියක් ලබා ගත යුතුවේ. | නිවැරදි හිඟ හිටි ශේෂ ලැයිස්තු අනුමත කර ගැනීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.8,766,539 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,372,964 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,857,000 | 11,015,758 | 3,720,238 | 24,838,169 | 8,880,000 | 11,556,050 | 6,178,196 | 22,363,307 |
| (ii) | කුලී | 2,270,680 | 361,280 | 334,910 | 184,054 | 1,672,680 | 931,070 | 829,920 | 291,031 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,552,000 | 2,181,345 | 2,181,345 | -- | 1,501,000 | 1,314,062 | 1,314,062 | -- |
| (iv) | වෙනත් ආදායම් | 64,228,000 | 62,219,535 | 754,054 | 55,224,034 | 33,424,662 | 37,161,240 | 7,699,180 | 69,340,774 |
| | එකතුව | 76,907,680 | 75,777,918 | 81,446,997 | 80,246,257 | 45,478,342 | 50,962,422 | 16,021,358 | 91,995,112 |

**2.2.2** <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | ---------------------- |
| (අ) | වරිපනම් ----------- | | |
| (i) | 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ වරිපනම් ආදායම් එකතු කිරීමේ දී, සිදුව තිබූ මූල්‍ය අක්‍රමිකතාවයන් අනාවරණය වීමත්, එකී මූල්‍ය අක්‍රමිකතාවයන්ට අදාළව තවමත් ක්ෂේත්‍රය තුළින් කරුණු හෙළිදරව් වෙමින් පවතින බව ආදායම් පරීක්ෂකවරු ප්‍රකාශ කිරීමත් සහ මූලික හා අවසන් පරීක්ෂාවන් තුළින් රු.1,028,451 ක වරිපනම් හිඟශේෂයක් අය කර ගත යුතු වරිපනම් වංචා ගිණුම ලෙස සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමත්, පසුගිය වර්ෂයේ දී පැවති මෙම ශේෂය නිරවුල් නොවීමත් යන හේතූන් මත සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.24,838,169 ක හිඟ හිටි වරිපනම් ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත් විය නොහැකි විය. | අදාළ ක්‍රියාමාර්ග ගැනීම හා හිඟ ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි හිඟය හඳුනා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |
| (ii) | රජයේ ආයතනවලින් දිගු කාලයක සිට අය විය යුතු රු.248,184 ක වරිපනම් බදු අය කර නොතිබුණි. | හිඟ ශේෂ අය කළ යුතුවේ. | හිඟ අය කර ගැනීම සඳහා අදාළ ආයතනවලට ලිපි යවා ඇත. |
| (ආ) | අක්කර බදු -------------- | | |
| | හිඟ අක්කර බදු රු.245,796 ක් අය කර නොතිබුණි. | නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නිවැරදි ශේෂය හඳුනා ගෙන ඉදිරියේ දී අය කිරීමට කටයුතු කරමි. |

**2.2.3** <u>වෙනත් ආදායම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | -------------------------------- |
| (අ) | ත්‍රී රෝද රථ ගාස්තු ---------------------- | | |
| | රු.1,500,000 ක් වූ ඇස්තමේන්තුගත ත්‍රිරෝද රථ ගාස්තු ආදායමෙන් රු.26,400 ක ආදායමක් පමණක් රැස් කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂක පුරප්පාඩු නිසා, මෙම තත්ත්වය ඇති වූ බව දන්වා ඇත. |

(ආ) දැන්වීම් පුවරු ආදායම

| ----------------------- | ----------------------- | ----------------------- |
| --- | --- | --- |
| දැන්වීම් පුවරු 25 කින් ලැබිය යුතු රු.532,600 ක ආදායමක් අය කර නොතිබුණි. | දැන්වීම් පුවරු ආදායම් අය කළ යුතුවේ. | මෙම වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------ | ------------- | ------------------------------- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.15,357,540 ක් හා මුද්දර ගාස්තු රු.37,793,424 ක් අය විය යුතුව තිබුණි. | ලැබිය යුතු මුදල් අය කර ගත යුතුවේ. | කොටසක් ලැබී ඇති අතර, අනෙක් මුදල් ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| | ----------------------- | ------------- | ------------------------------- |
| (i) | බැකෝ යන්ත්‍රය කුලියට දීම මඟින් අපේක්ෂිත රු.500,000 ක ආදායම උපයා නොතිබුණි. | ඇස්තමේන්තුගත ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ii) | 2019 වර්ෂය තුළ අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත්‍ර 202 න් අයදුම්පත්‍ර 140 ක් සඳහා වූ ඉදිකිරීම්වල නව තත්ත්වය සම්බන්ධව පසු විපරම් කර නොතිබුණි. | නිවැරදි පසු විපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුවේ. | විෂය නිලධාරී හා ක්ෂේත්‍ර නිලධාරී දැනුවත් කර ඇත. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ----------------------- | ------------- | -------------------- |
| සභාව විසින් බල ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් විවිධ වූ කාර්යයන් ක්‍රියාත්මක කරන නමුත්, ඒවා තිරසර සංවර්ධන ඉලක්ක සමඟ කෙසේ ගැළපේ ද, යන්න පිළිබඳ ඇගයීමක් හා පසු විපරම් ක්‍රියාවලියක් සිදු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ පසු විපරම් කළ යුතුවේ. | මෙම විෂය නිලධාරියෙකු වෙත විධිමත්ම පවරා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සේවක පුරප්පාඩු 15 ක් සහ එක් අතිරික්ත සේවකයෙකු විය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර, අනුමැතිය ලද පසු බඳවා ගැනීම් සිදු කරමි. |

**3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයෙන් පසු අක්කර බදු පිළිබඳ සමීක්ෂණයක් කිරීමට හා බිල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර ඇත. |
| (ආ) | 1982 අංක 04 සහ 1984 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත අනුව, හඳුනාගත් අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස විෂයය නිලධාරී දැනුවත් කර ඇත. |
| (ඇ) | **ත්‍රීරෝද රථ ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයට අදාළව ත්‍රීරෝද රථ සම්බන්ධ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සමීක්ෂණ කටයුතු සිදු කළ යුතුවේ. | ආදායම් පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු නිසා, මෙම තත්ත්වය ඇති වී ඇති අතර, ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) | **දේපළ බදු දීම සම්බන්ධ අඩුපාඩු** | | |
| (i) | ගෙලිඔය බස් නැවතුම් පොල පිටු පස වළං වෙළඳසැලෙන් තක්සේරු වාර්තා ලබා ගැනීමකින් තොරව මාසික කුලියක් අයකර තිබූ අතර, 2019 වර්ෂය සඳහා ලැබියයුතු රු.84,800 ක කුලි මුදල් අයකර නොතිබුණි. | නව තක්සේරු කිරීම් හා හිඟ මුදල් අය කළ යුතුවේ. | අයිතිය තහවුරු කර ගැනීම සඳහා ගමනාගමන මණ්ඩලය වෙත දැනුම් දී ඇත. |
| (ii) | සභාවට අයත් ඇල්පිටි කන්ද පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටි කාමර 02 ක් ග්‍රාම නිලධාරී හා තැපැල් කාර්යාලයක් පවත්වා ගෙන යාමට තක්සේරු වාර්තා ලබා ගැනීමකින් හා ගිවිසුම්ගත වීමකින් තොරව ලබා දී තිබුණි. | නිවැරදිව වත්කම් පැවරිය යුතුවේ. | ඉදිරියේ දී අදාළ ක්‍රියාමාර්ග ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | අලපලාවල පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටි ග්‍රාම නිලධාරී හා සංවර්ධන නිලධාරී කාර්යාලය තක්සේරු වාර්තා ලබා ගැනීමකින් හා ගිවිසුම්ගත වීමකින් තොරව කුලී පදනම මත ලබා දී තිබුණි. | නිවැරදිව ගිවිසුම්ගත විය යුතුවේ. | ඉදිරියේ දී ගිවිසුම්ගත වීමට කටයුතු කරමි. |
| (iv) | දැල්වැටිය ප්‍රජා ශාලාව - තේ පැළ තවාන 2013 වර්ෂයේ සිට ගිවිසුම්ගත වීමකින් හා තක්සේරු වාර්තා ලබා ගැනීමකින් තොරව බදු දී තිබුණි. | ගිවිසුම්ගත වීමට හා හිඟ මුදල අය කිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.4** <u>වත්කම් කළමනාකරණය</u>

**3.4.1** <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.17,721,100 ක් වටිනා වාහන 10 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන අලුත්වැඩියා කිරීමට හෝ අදාළ වෙනත් ක්‍රියාමාර්ග සඳහා යොමු කළ යුතුවේ. | 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මඟින් වෙන්දේසි කිරීමට තීරණය කර ඇත. |

**3.4.2** <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------------------- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයට අනුව, සභාව සතු වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුවේ. | අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වැඩ අධිකාරී දැනුවත් කර ඇත. |

**3.5** <u>අවිධිමත් ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------------------- |
| 2019 වර්ෂයට දුරකථන දීමනා ගෙවීම සඳහා අයවැය යටතේ ප්‍රතිපාදන සලසා නොතිබිය දී, වෙනත් වැය විෂයයකින් ඒ සඳහා රු.205,076 ක් දරා තිබුණි. | වෙන් කළ ප්‍රතිපාදන යටතේ පමණක් වියදම් දැරිය යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ----------------------------------- |
| (අ) | 2018 – 1.4(ඈ)<br>-------------------<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව, අදාළ ක්‍රියාමාර්ග නොගෙන වටිනාකම රු.450,826 ක් වූ තැන්පතු 223 ක් අවුරුදු 29 ක කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වටිනාකම් හඳුනා ගෙන ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 - 3.4.2(අ)<br>------------------<br>වටිනාකම රු.374,501 ක් වූ ජල නළ උපාංග අයිතම 2235 ක් වසර 10 කට වඩා වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ජල ගබඩාවේ පැවතුණි. | වත්කම් නිෂ්ක්‍රීය වීමට ඉඩ නොහැර භාවිතයට ගත යුතුවේ. | කොටසක් වෙන්දේසි කර ඇති අතර, ඉතිරි උපකරණ භාවිතයට යොදා ගනිමි. |